ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ நிலையம்
DISASTER MANAGEMENT CENTRE

අංක 120/2,
විද්‍යා මාවත,
කොළඹ 07

எண் 120/2
வித்யா மாவத்தை
கொழும்பு 07

No 120/2,
Vidya Mawatha,
Colombo 07


ඔබේ අංකය
உமது இல
Your No.

මගේ අංකය
எனது இல
DMC/ 08/ Weather Forecast

දිනය
திகதி
2026.04.06

යුද්ධ හමුදාධිපති,

ගුවන් හමුදාපති,

නාවික හමුදාධිපති,

පොලිස්පති,

අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව,

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනයයි.</u>**

2026.04.06 වන දින 0530 පැයට කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද කාලගුණ නිවේදනය හා බැදේ.

02. එබැවින් සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරිමට / පාලනය කර ගැනිමට හා කළමනාකරණය කර ගැනිම සඳහා මෙම නිවේදනය අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. තවද එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිවේදන පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන මෙන් ද මෙම නිවේදන පිළිබඳ විස්තර ලබා ගැනිම සඳහා 117 දුරකථන අංකය අමතන ලෙසටද වැඩිදුර තාක්ෂණික උපදෙස් ලබා ගැනිම සඳහා **<u>කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව</u>** සමඟ සම්බන්ධීකරණය වන ලෙසටද දන්වා සිටිමි.

කේ.ඒ.ඩී.පී..කේ.කොඩිප්පිලි

අධ්‍යක්ෂ (දැනුවත් කිරීම හා පුහුණු)

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2026 අප්‍රේල් මස 06 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2026 අප්‍රේල් මස 06 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

උතුරු, නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් පුත්තලම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ප.ව 2.00 න් පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

බස්නාහිර පළාතෙත් පුත්තලම සහ යාපනය දිස්ත්‍රික්කවලත් වෙරළබඩ ප්‍රදේශවල උදෑසන කාලයේදීත් වැසි ඇති විය හැක.

මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත්වලත් අම්පාර දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශවලට සෘජුවම ඉහලින් පවතී. අද(06) දින දහවල් 12:13 ට බේරුවල, ගුරුළුබැද්ද, රක්වාන, ගොඩකවෙල, උඩවලව සහ තණමල්විල යන ප්‍රදේශවලට හිරු මුදුන් වනු ඇත.**

## WEATHER FORECAST FOR 06 APRIL 2026
**Issued at 05.30 a.m. on 06 April 2026.**

Showers or thundershowers will occur at several places in Northern, Eastern, North-central, Central and Sabaragamuwa provinces and in Puttalam, Galle and Matara districts after 2.00 p.m.
Showers may occur in coastal areas of Western province and in the Puttalam and Jaffna districts in the morning.

Misty conditions can be expected at some places in Central, Sabaragamuwa and Uva provinces and in Ampara district during the early hours of the morning.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

**On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka during 05$^{th}$ to 15$^{th}$ of April in this year. The nearest areas of Sri Lanka over which the sun is overhead today (06$^{th}$) are Beruwala, Gurulubadda, Rakwana, Godakawela, Udawalawe and Thanamalwila at about 12:13 noon.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2026 අප්‍රේල් මස 06 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| **වැසි තත්ත්වය:** |
| කන්කසන්තුරේ සිට මන්නාරම, පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |
| **සුළඟ:** |
| සුළං නිරිත හෝ බස්නාහිර දිශා වලින් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. (25-35) පමණ වේ. ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (40-45)** දක්වා වැඩි විය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ හෝ මඳ වශයෙන් රළු ව පවතිනු ඇත.<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
**Issued at 05.30 a.m. on 06 April 2026**

| |
|---|
| **Condition of Rain:** |
| Showers or thundershowers are likely at a few places in the sea areas off the coast extending from Kankasanthurai to Pottuvil via Mannar, Puttalam, Colombo, Galle and Hambantota. |
| **Winds:** |
| Winds will be South-westerly or Westerly in direction. Wind speed will be (25-35) kmph. Wind speed can increase up to **(40-45) kmph** at times in the sea areas off the coast extending from Galle to Pottuvil via Matara and Hambantota. |
| **State of Sea:** |
| The sea areas off the coast extending from Galle to Pottuvil via Matara and Hambantota may be fairly rough at times. The other sea areas around the island may be slight or Moderate.<br>**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි